# පුංචි මිතුගේ උපන්දිනය



රුහන්සා දහම්දී රූපසිංහ

කෘතියේ නම - පුංචි මිතූගේ උපන්දිනය

**ISBN** අංකය - 978-624-208-492-3

කතෘගේ නම - රුහන්සා දහම්දී රූපසිංහ
පාසල - මහාමායා බාලිකා විදුහල - මහනුවර
පන්තිය - **4** ශ්‍රේණිය **E**

කෘතිය පළ කරන දිනය **-2025.02.08**

කතෘගේ වෙනත් කෘතීන්-මලී අම්මා කියන දේ අහන්න

**ISBN** අංකය - 978-624-208-101-4

# පිදුම

## මාගේ දෙමව්පියන්ට
## සහ
## උදවු කල සියලු දෙනාට
## ආදරෙන් පුදමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ලස්සන දවසක් උදාවුණා..

අද තමයි පුංචි මිතූගේ උපන්දිනය.

මිතූ උදෑසනම අවදිවෙලා අම්මා ළඟට දුවගෙන ආවා.

අම්මේ...,අම්මේ...,අද මගේ උපන්දිනය,

අද මගේ උපන්දිනය.........

මට හරිම සතුටුයි කියලා උඩපනිමින් කෑගසුවා.



''ඔව් ඔව් මගේ දුවේ, අද මගේ චූටි දූගේ උපන්දිනේ තමයි''

අම්මා ආදරෙන් මිතූගේ හිස අතගෑවා.

අම්මේ,අද අපි මොකද කරන්නේ?

අපි අද උදෙන්ම පන්සල් ගිහින් මල් පහන් පූජා කරලා

බුදුන් වැදලා ආශීර්වාද ලබාගන්න ඕනේ..

"මගේ මැණික ඉක්මණින් ගිහින් ලැහැස්ති වෙන්න" අම්මා කිව්වා.

මිතූ ඉක්මණින් මූණ කට සෝදා ලස්සන ඇඳුමක්

ඇඳගෙන ආවා.මිදුල අයිනේ තිබුණු පිච්ච ගහෙන් පිච්ච

මල් වට්ටියක්ම කඩා ගත්තා.



මිතූ අම්මාත් එක්ක සතුටෙන් පන්සල් ගිහින් බුදුන් වැන්දා..

ගමේ පන්සලේ ලොකු හාමුදුරුවෝ මිතූට ආශීර්වාද කලා.
මිතූට හරිම සතුටුයි.

“අපි දැන් ඉක්මණින් ගෙදර යමු”. අම්මා කිවුවා.

මිතු අම්මත් එක්ක ගෙදර ඇවිත් උපන්දින කේක එක

සැදීමට අම්මාට උදව් කලා.

ශා….,හරිම ලස්සනයි අම්මේ.

මගේ යහළුවන්ට හරිම සතුටු හිතේවි.

“අම්මට ගොඩාක් ස්තූතියි මේ වගේ ලස්සන උපන්දින

උත්සවයක් සූදානම් කලාට”. මිතු නැවත වරක් අම්මා

බදාගනිමින් ඇයට ස්තූති කලා.

සවස්වන විට මිතූගේ යහළුවන් උපන්දින සාදයට
නිවසට ආවා.



මිතූට තම යහළුවන්ගෙන් ලස්සන ලස්සන තෑගි බෝග ගොඩාක් ලැබුණා.

"මෙන්න මගේ මැණිකට අම්මාගෙන් පොඩි තෑගගක්"

අම්මා ලස්සනම ලස්සන බෝනික්කෙක් මිතූගේ අතට දීලා ඇයව ආදරෙන් තුරුළු කර ගත්තා.

"මේ තෑග්ග මගෙන්"තාත්තා කිව්වා.

"ගොඩක් ස්තූතියි මගේ තාත්තේ"

මිතූ තාත්තාට කිව්වා.

ආනේ....,

මේ තමයි මම තාත්තාගෙන් ඉල්ලපු සුදු හා පැංචා...

අද මට ඒක ලැබුණා......මට හරි සතුටුයි.. මට හරි සතුටුයි..

"මේ තමයි මගේ හොඳම උපන්දිනය..."

මිතූ තමාටම කියාගත්තා.



ISBN- 978-624-208-492-3

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්